සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය - I

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 01යි.

සැලකිය යුතුයි.

(1) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(2) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(3) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ මූලාරම්භය ඇති වූයේ යැයි සැලකෙන්නේ පහත සඳහන් කුමන රාජ්‍යයේ ද?
(1) ස්පාටා (2) ඇතැන්ස් (3) වජ්ජි (4) මල්ල

(02) ජනතා නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ,
(1) රුසියන් විප්ලවයෙනි (2) ප්‍රංශ විප්ලවයෙනි (3) ඇමරිකන් විප්ලවයෙනි (4) ඉංග්‍රීසි විප්ලවයෙනි

(03) ලෝකය පුරා ජාතික රාජ්‍ය බිහි වීමට බලපෑ හේතුවක් වන්නේ,
(1) විද්‍යාත්මක දැනුම වර්ධනය වීම (2) යුධ හා නාවික ශක්තිය
(3) දියුණු ආර්ථික තත්ත්වය (4) ජාතික ඒකාග්‍රතාවය

(04) ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක මණ්ඩලයේ කාර්යයන් වන්නේ,
(1) නීති සම්මත කිරීම, නීති ක්‍රියාත්මක කිරීම (2) අයවැය පාලනය කිරීම, නීති ක්‍රියාත්මක කිරීම
(3) නීති සම්මත කිරීම, මුදල් පාලනය (4) නීති සම්මත කිරීම, පුරවැසි අයිතිවාසිකම් සුරැකීම

(05) ශ්‍රී ලාංකික පුරවැසියෙකුට ඡන්දය භාවිත කිරීම සඳහා සුදුසුකම් ලබන වයස් සීමාව වන්නේ,
(1) වයස අවුරුදු 18 සම්පූර්ණ කිරීම (2) වයස අවුරුදු 20 සම්පූර්ණ කිරීම
(3) වයස අවුරුදු 21 සම්පූර්ණ කිරීම (4) වයස අවුරුදු 24 සම්පූර්ණ කිරීම

(06) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු විසින් සමාජය වෙත ඉටු කළයුතු යුතුකම් වර්ග දෙක වන්නේ,
(1) සිවිල් හා නීතිමය යුතුකම් (2) සිවිල් හා දේශපාලන යුතුකම්
(3) ආර්ථික හා සමාජයීය යුතුකම් (4) නීතිමය හා සදාචාරාත්මක යුතුකම්

(07) රාජ්‍යයක් තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ වන්නේ,
(1) භූමිය, ජනගහනය, ආණ්ඩුව, පරමාධිපත්‍ය බලය (2) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ජනාධිපති බලය
(3) භූමිය, ජනගහනය, පරමාධිපත්‍ය බලය, ආධිපත්‍යය (4) භූමිය, ජනගහනය, ආණ්ඩුව, නීතියේ ආධිපත්‍යය

(08) ජනාධිපති ආණ්ඩු ක්‍රමයක විශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තෝරා පත් වෙයි
(2) විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව ඇත
(3) විධායක බලය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා
(4) නාමික විධායකය හා සත්‍ය විධායකය යන අංග දෙකකින් සමන්විත වේ

(09) රටක නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණයක් වන්නේ,

(1) නව නීති සකස් කර වැරදිකරුවන්ට දඬුවම් දීම (2) සමාජ තරාතිරම අනුව නීතිය ක්‍රියාත්මක කිරීම

(3) නීතිය ඉදිරියේ සමානාත්මතාව (4) චෝදනාවක් නැතත් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම

(10) මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම යනු,

(1) බලය බෙදා හැරීමයි (2) බලය පවරා ගැනීමයි

(3) බලය විමධ්‍යගත කිරීමයි (4) බලය ශක්තිමත් කිරීමයි

(11) සන්ධීය රාජ්‍යයක බලය බෙදා හැරීම සිදුවන්නේ,

(1) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුව අතර ය. (2) මධ්‍යම ආණ්ඩුව හා ජනාධිපති අතර ය.

(3) ජනාධිපති හා අගමැති අතර ය. (4) ප්‍රාන්ත ආණ්ඩු හා ජනාධිපති අතර ය.

(12) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවක මහ ඇමතිවරයා ඇතුළුව අමාත්‍යවරුන් සංඛ්‍යාව වනුයේ.

(1) 4 කි (2) 5 කි (3) 6 කි (4) 8 කි

(13) ඇමරිකා එක්සත් ජනපදයේ උත්තර මන්ත්‍රී මණ්ඩලය හඳුන්වන්නේ,

(1) ඩයට් සභාව (2) මහා සභාව (3) සෙනෙට් සභාව (4) ජාතික රාජ්‍ය සභාව

(14) මෙරට පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත්කරනු ලබන්නේ,

(1) අගමැති තුමා ය (2) මහ ඇමති තුමා ය (3) අග්‍රවිනිශ්චයකාර තුමා ය (4) ජනාධිපතිතුමා ය

(15) පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය වන්නේ,

(1) පුරවැසි සභාව (2) මහා සභාව (3) රාජ්‍ය මන්ත්‍රණ සභාව (4) කාරක සභාව

(16) බලයේ අවසාන හිමිකරුවා වන්නේ මහජනතාවයි. එම බලය හඳුන්වනු ලබන්නේ,

(1) පරමාධිපත්‍ය බලය. (2) අධිකාර බලය. (3) ආධිපත්‍ය බලය. (4) ස්වාධිපත්‍ය බලය.

(17) විවිධත්වය තුළ එක්සත්භාවය ඇති කිරීම වඩාත් අවශ්‍ය වන්නේ,

(1) ඒකීය රාජ්‍යයක් තුළ ය. (2) සන්ධීය රාජ්‍යයක් තුළ ය.

(3) ජාතික රාජ්‍යය තුළ ය. (4) ජනපති ආණ්ඩුව පවතින ජාතික රාජ්‍ය තුළ ය.

(18) පරිපාලන බලතල ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා අනුපිළිවෙලින් දැක්වෙන්නේ,

(1) දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්. අමාත්‍යාංශ ලේකම්.

(2) ප්‍රාදේශීය ලේකම්. දිස්ත්‍රික් ලේකම්, අමාත්‍යාංශ ලේකම්.

(3) අමාත්‍යාංශ ලේකම්, දිස්ත්‍රික් ලේකම්. ප්‍රාදේශීය ලේකම්.

(4) අමාත්‍යාංශ ලේකම්. ප්‍රාදේශීය ලේකම්. දිස්ත්‍රික් ලේකම්.

(19) බහු සංස්කෘතික සමාජයක එක්සත්ව කටයුතු කිරීමෙන්,

(1) ගැටුම් වර්ධනය වේ. (2) සාමූහිකත්වය වර්ධනය වේ.

(3) අවිශ්වාසය වර්ධනය වේ. (4) දූෂණය වර්ධනය වේ.

(20) "වෙනස්කම් තුළින් එකමුතු බව" තේමාව කරගත් රටක් වන්නේ,

(1) චීනය, (2) ජපානය. (3) ඕස්ට්‍රේලියාව. (4) ස්විට්සර්ලන්තය.

(21) මිනිසාගේ මූලික අවශ්‍යතා ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ආහාර, ඇඳුම්, නිවාස. (2) ආහාර, වාහන, නිවාස.

(3) ඇඳුම්, ඖෂධ, ජලය. (4) ඇඳුම්, වාහන, ජලය.

(22) ආර්ථික භාණ්ඩයක් හා ආර්ථික නොවන භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ඖෂධ හා හිරු එළිය (2) ඇඳුම් හා ආහාර.

(3) ජලය හා වාතය. (4) ඇඳුම් හා නිවාස.

(23) ආර්ථික සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ,

(1) මුළු ජාතික නිෂ්පාදිතය වසරින් වසර වැඩිවීම ය.

(2) මූර්ත දේශීය නිෂ්පාදිතය වසරින් වසර වැඩිවීම ය.

(3) මුළු දේශීය නිෂ්පාදිතය වසරින් වසර වැඩිවීම ය.

(4) මූර්ත ජාතික නිෂ්පාදිතය වසරින් වසර වැඩිවීම ය.

(24) නිෂ්පාදන කාර්යයේදී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගන්නා නිෂ්පාදන ශිල්පීය ක්‍රමය හඳුන්වන්නේ,

(1) ප්‍රාග්ධන සූක්ෂම නමිනි. (2) ශ්‍රම සූක්ෂම නමිනි.

(3) මූල්‍ය සූක්ෂම නමිනි. (4) භාණ්ඩ සූක්ෂම නමිනි.

(25) වී නිෂ්පාදනය සඳහා යොදා ගන්නා "අන්තර් භාණ්ඩ" ඇතුලත් පිළිතුරු කාණ්ඩය වන්නේ.

(1) වාහන, බිත්තර වී. (2) පොහොර, බිත්තර වී.

(3) බිත්තර වී, ගොඩනැගිලි. (4) පොහොර, සහල්.

(26) මිනිස් අවශ්‍යතා ඉටුකරගැනීමට යාමේදී ගැටළු මතුවීමට ප්‍රධාන හේතුවක් වන්නේ,

(1) පුද්ගලයාගෙන් පුද්ගලයාට අවශ්‍යතා වෙනස් වීමයි.

(2) අවශ්‍යතා පිරිමසා ගැනීමට අවශ්‍ය සම්පත් සීමිත වීමයි.

(3) අවශ්‍යතා පිරිමසා ගැනීමට අවශ්‍ය දැනුම නැති වීමයි.

(4) අවශ්‍යතා පිරිමසා ගැනීමට මුදල් නොමැති වීමයි.

(27) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ මැදිහත්වීම පමණක් දැකිය හැකි අංශයකි.

(1) අධ්‍යාපනය (2) සෞඛ්‍යය (3) දුම්රිය ගමනාගමනය (4) වෙළඳාම

(28) නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ.

(1) රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලිකරණය කිරීම. (2) රාජ්‍ය ව්‍යවසාය සැලසුම් කිරීම.

(3) පාලන නීතිරීති සීමා වර්ධනය කිරීම. (4) ආර්ථික කටයුතු වලට රාජ්‍ය අංශයේ මැදිහත්වීම.

(29) සමාජවාදී අර්ථ ක්‍රමයක් හඳුන්වන තවත් ආකාරයක් වන්නේ,

(1) පෞද්ගලික ව්‍යවසාය අර්ථ ක්‍රමය. (2) වෙළඳපොළ අර්ථ ක්‍රමය.

(3) මිශ්‍ර අර්ථ ක්‍රමය. (4) රාජ්‍ය ව්‍යවසාය අර්ථ ක්‍රමය.

(30) A - ඇමරිකා එක්සත් ජනපදය

B - උතුරු කොරියාව

C - ශ්‍රී ලංකාව

D - ජපානය

ඉහත සඳහන් රටවල් අතරින් ධනවාදී අර්ථක්‍රම පවතින රටවල් කාණ්ඩය වන්නේ.

(1) A සහ D (2) A සහ B (3) B සහ C (4) C සහ D

(31) පරිවර්තන ආර්ථිකයන්හි දැකිය හැකි මූලික ලක්ෂණයක් නොවන්නේ.

(1) පෞද්ගලික ව්‍යවසායන් දිරිගැන්වීම. (2) ආර්ථිකය ලිහිල් කිරීම.

(3) දේපල අයිතිය රාජ්‍ය අංශය සතුවීම. (4) දේපල අයිතියට පෞද්ගලික අංශයට ලබාදීම.

(32) ශ්‍රී ලංකාවට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දෙනු ලැබුවේ,

(1) 1948 න් පසුව ය. (2) 1972 න් පසුව ය. (3) 1976 න් පසුව ය. (4) 1977 න් පසුව ය.

(33) "දකුණු ආසියාතික වරණාත්මක වෙළඳ ගිවිසුම" යන්න කෙටියෙන් හඳුන්වන්නේ,

(1) සාර්ක් නම්නි. (2) සප්තා නම්නි. (3) විම්ස්ටෙක් නම්නි. (4) ආසියාන් නම්නි.

(34) පුද්ගලයෙකුගේ අසාමාන්‍ය චර්යා කෙරෙහි බලපාන ප්‍රබල හේතුවක් වන්නේ මිනු තුළ ඇතිවන,

(1) ආතතිය. (2) සහානුභූතිය. (3) සංවේදීතාව. (4) සහමිත්‍රත්වය.

(35) ගැටුම් ඇති විමට පුද්ගල මනස මුල් වේ. ඒ නිසා ගැටුම් නිරාකරණය සඳහා වඩාත්ම සුදුසු වන්නේ,

(1) වෛද්‍යවරයෙකු හමුවීම. (2) මැදිහත්කරුවෙකුගේ සහාය පැතීම.
(3) මානසික පාඨය ඇති කිරීම. (4) සමථ මණ්ඩලයට යොමු කිරීම.

(36) ජාතික මට්ටමින් හෙවත් පුළුල් මට්ටමින් ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,

(1) සමාජීය ගැටුම්. (2) පුද්ගල ගැටුම්. (3) පාර්ශ්ව ගැටුම්. (4) අභ්‍යන්තර ගැටුම්.

(37) I හා II ලෝක සංග්‍රාම අති විනාශකාරී යුද්ධ වේ. මෙම යුද්ධ හඳුන්වන්නේ,

(1) මතවාද ගැටුම්. (2) වාර්ගික ගැටුම්. (3) ආගමික ගැටුම්. (4) ජාත්‍යන්තර ගැටුම්.

(38) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගත හැකි සුදුසු ක්‍රමයක් නොවන්නේ,

(1) සම්ථකරණය. (2) වෛරම්කරණය. (3) තර්ජනය කිරීම. (4) සේවල් කිරීම.

(39) පංතියේ මිතුරන් අතර ඇතිවන ගැටුම්කාරී අවස්ථාවකදී ගැටුම් නිරාකරණය සඳහා ඔබ "මැදිහත්කරුවෙකු" වන්නේ නම් ඔබ,

(1) පක්ෂපාතී පුද්ගලයෙකු විය යුතුයි. (2) වංචාව කට්යුතු කරන්නෙකු විය යුතුයි.
(3) මනා සවන්දෙන්නෙකු විය යුතුයි. (4) අවචාරශීලී පුද්ගලයෙකු විය යුතුයි.

(40) තමා වෙත එල්ලවන අභියෝග ජයගැනීම් සඳහා පුද්ගලයෙකු විසින් වර්ධනය කරගත යුතු සමාජීය ගුණාංගයක් වන්නේ,

(1) කරුණාව (2) මුදිතාව (4) සංවේදීතාව (4) වරිතාගය

(ලකුණු 1 × 40 - 40)

සියලු හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

### 10 - ශ්‍රේණිය

### පුරවැසි අධ්‍යාපනය - II

කාලය: පැය 02යි.

නම/විභාග අංකය :- ..............................................................................

- පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(ii) රාජ්‍යයකට පැවරෙන කාර්යයන් දෙකක් ලියන්න.

(iii) රාජ්‍යය යන්නට නිර්වචන ඉදිරිපත් කළ ප්‍රකට පුද්ගලයින් දෙදෙනකු නම් කරන්න.

(iv) ඡන්ද කොට්ඨාශ ක්‍රමය අනුව මහජන නියෝජිතයින් තෝරා ගැනීම නිසා ඇති විය හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

(v) ඒකීය රාජ්‍යයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(vi) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් ලියන්න.

(vii) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් දක්වන්න.

(viii) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සාධක දෙකක් ලියන්න.

(ix) ජෝන් ගැල්ටුංගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියෙහි දැක්වෙන ගැටුම් ඇති වීම කෙරෙහි බලපාන මූලික හේතු දෙකක් දක්වන්න.

(x) ගැටුම් සාමකාමීව විසඳා ගැනීම නිසා අත්කර ගත හැකි වාසි දෙකක් දක්වන්න. (ලකුණු 2 × 10 =20)

(02) (i) ප්‍රජාතන්ත්‍රවාදය යන්නට නිර්වචන සැපයූ ප්‍රකට පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) වජ්ජි ජනපද පාලනයේ දී අනුගමනය කළ සප්ත අපරිහානිය ධර්ම වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී පාලනය තුළ දී දැකිය හැකිය. එම සප්ත අපරිහානි ධර්ම තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ග්‍රීසියේ පොර රාජ්‍යවල පැවැති පාලන ක්‍රමය වර්තමානයේ දී ක්‍රියාත්මක කිරීමේ දී ගැටලු පැන නැගේ. එවැනි ගැටලු තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු වූ කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) සන්ධීය රාජ්‍යයක ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් තුනක් ලියන්න. (ලකුණු 03)

(b) සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(04) (i) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) යහපාලනයක මූලික ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) බහු සංස්කෘතික සමාජයක "යහපාලනය" ක්‍රියාත්මක කිරීමෙන් ඇති විය හැකි යයි සැලකෙන ප්‍රයෝජන තුනක් නම් කර ඉන් එකක වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) ඕනෑම ආර්ථිකයකට මුහුණ දීමට සිදු වන මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලින් ප්‍රධාන කොටස් තුනකට වර්ග කොට ඇත. ඒවා නම් කරන්න. (ලකුණු 03)

(iii) ධනවාදී අර්ථක්‍රමයක මූලික ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

(06) (i) ශ්‍රී ලංකාවේ දැනට සිදුවෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) එම සංවර්ධන ව්‍යාපෘති නිසා රටට අත්වන වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ගෝලීයකරණය හේතුවෙන් ශ්‍රී ලංකාවට අත් වී තිබෙන ධනාත්මක බලපෑම් තුනක් සඳහන් කර ඉන් එකක වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) ගැටුම් ඇතිවීමට බලපාන ප්‍රධාන මූල දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ගැටුම් නිරාකරණය සඳහා සමථකරණය යොදාගත හැකි අවස්ථා තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ගැටුම් සාමකාමීව විසඳා නොගැනීම නිසා මුහුණපාන්නට සිදුවන දුෂ්කරතා සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)